# අපූරු තෑග්ගක්




ඔනදී දිමන්සා අබේසිංහ

# අපූරු තෑග්ගක්

## ඔනදි දිමන්සා අබේසිංහ

පළමු දිගහැරුම

මහමායා බාලිකාව විදුහල මහනුවර
8A
2026.06.10

978-
624-
211-
420-0

# පිදුම

මාව සෑදූ මගේ

පළමු ගුරු දෙපළටත්,

දැනුමේ

ආලෝකය පෑ

මහත්ම මහත්මීන්ටත්,

උපහාරයේ ආදර්ශයක් වූ

"හේමමාලා උපහාර "

වැඩසනටත්

මේ පොතේ සෑම අකුරක් ම
පිදෙමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ගිලානා රාජධානිය ඉතාමත් සමෘද්ධිමත් රාජධානියකි.මෙය බොහෝ සතුන්ට නිවහනක් වූවේ ය. ගිලෝනා වැසියෝ සතුටින් ජීවත් වන බුද්ධිමත් වූ නිසා අනෙක් රාජධානිය අතර කැපී පෙනෙන්නට විය.

වෙන් වීමට කළුගඟ හා මෝලා කඳුවැටිය උපකාර වේ. ගිලානා යනු ගිලෝනා රාජ්‍යයේ අගනුවරයි.ගිලානා නගරයේ ප්‍රධාන වීදියේ ඇති බේකරිය හා පළතුරු වෙළෙඳ සැල අතර ඇති අතුරු මාර්ගයේ තෙවන නිවස තරමක් වෙනස් ආකාරයක නිමාවක් දක්නට ඇත.එහි තරමක් අමුතු නමුත් , අපූරු මිතුරෙක් ජීවත් විය.ඇත්තෙන්ම අපූරු මිතුරෙකු නොව මිතුරියක් විය. ඇය නමින් ලෝරා විය.

රෝරා යනු හිවල් ධේනු පැටියෙකි.ඇය හට දුඹුරු පාට ඇස් තිබූ අතර හිම වැනි සුදු පැහැති ලොම් තිබූ අතර එම ලොම් මත රෝස පැහැති තිත් වැනි යමක් තිබෙන්නට විය. ඒ මෙන්ම ඇය කරුණාවන්ත වූවා ය. ඇය ජීවත් වූයේ තම මව වූ සුසී සමඟය . ඇයගේ මව වූ සුසි කඩිසර මෙන්ම ක්‍රියාශීලි අයෙකි.

සුසී වෙනදා මෙන්ම උදෑසන ආහාරයට පාන් සාදමින් සිටියා ය. එවිට ඔල්ලෝසුවේ වේලාව උදෑසන 6.00 යැයි ඇය දුටුවා ය .

"රෝ... රා .... දැන් වෙලාව උදේ හයයි නැගිටින අද ඉස්කෝලෙ යන්න තියෙනවා." යැයි කියමින් ඇය උඩු මහලේ ඇඳක් මත සුව නින්දේ සිටි ලෝරාව අවදි කළා ය.

"හරි අම්මා මං එන්නම්."රෝරා නිදිමතේ ම පවසන්නට විය. ඉන්පසු ඇය පාසල් යෑමට සූදානම් වූවා ය.වෙනදා මෙන්ම අදත් ලොරා තම බෑගය රැගෙන නිවසේ දොර අසලට ගියා ය.

"රෝරා ඔයාගේ කෑම පෙට්ටිය ?"යැයි කියමින් සුසී ලෝරාගේ කෑම්පෙට්ටියල් ගෙනවිත් දුන්නා ය.

"ආ...අමතක උනානේ thank you අම්මා " කෑම පෙට්ටිය ගනිමින් ලෝරා පැවසුවා ය.

"පරිස්සමින් ගිහින් එන්න" සුසී පැවසුවා ය.

"බායි අම්මා" යැයි කියමින් ලෝරා අත වනමින් නිවසින් පිටව ගියා ය.
නිවසින් පිටවූ රෝරා වීදිය දිගේ ගොස් බස් නැවතුම්පළට ළගා විය. එහිදී ඇයට ඇයගේ හොඳම මිතුරිය වූ ජෙනට් හමු විය.

"සුභ උදෑසනක් ජෙනට්!" යැයි රෝරා පැවසුවා ය.

"සුභ උදෑසනක් රෝරා!" ජෙනට් පැවසුවා ය.

ජෙනට් යනු සීබ්‍රා පැටියෙකි.අනෙක් සී සීබ්‍රලාගේ මෙන්ම ඇයට කළු ඇස් සහ කළු සුදු මිශ්‍ර වයිරන් තිබුණි.ඇය ඉතාමත් පක්ෂපාති සහ ධෛර්යයවන්ත අයෙකි.

සුළු මොහොතකින් පසු බස් රථය පැමිණියේ ය. මිතුරියන් දෙදෙනා කඩිමුඩියේ බස් රථයට නැග වාඩි විය.

දිඟ කතා බහකට වැඩුණු මිතුරියන් දෙදෙනා ඔවුන්ටත් නොදැනී ම පාසල වෙත ළඟා විය.

මොවුන්ගේ පාසල වූයේ ගිලානා උසස් පාසලයි. එහි සිසු සිසුවියන් රැසක් අධ්‍යාපනයේ යෙදෙයි.මෙහි ප්‍රධානාචාර්යවරයා වූයේ සර් ඔලිවර් ය.

sir, ඔලිවර් ගැන කිවහොත් ඔහු ගිලෝනා රාජධානියේ සිටි බුද්ධිමත් සහ ප්‍රසිද්ධ අයගෙන් කෙනෙකි.නැතහොත් උමතු බකමූණෙකි. ඔහු තමාගේ ඇස්වලට වඩා විශාල උපැස් යුවලක් දරා සිටින දුඹුරු පැහැ පිහාටු දරන කොළ පැහැ ඉතා දීප්තිමත් නේත්‍ර යුවලක් ඇති අයෙකි.

බස් රථයෙන් බැස පාසලට ඇතුළු වූ ශිෂ්‍යාවන් දෙදෙනා අනෙකු සිසුන් සමඟ පාසලට ඇතුල් වී තම පන්ති කරා ගමන් කරන්නට විය.

එකවරම ශබ්ද විකාශන යන්ත්‍රයෙන් නිවේදනයක් ඇසෙන්නට විය.

"හැකි ඉක්මනින් සියලු දෙනාම පාසලේ මැද මිදුලට රැස් වන්න. නැවතත් එම නිවේදනය හැකි ඉක්මනින් සියලු දෙනාම පාසලේ මැද මිදුලට රැස්වන්න."

සියලු දෙනාම එක් වරම කසු කුසු ගාන්නට වූයේ එක්වරම මෙසේ පැමිණෙන්න කිවේ මන්දැයි සිතා ය. සියලු සිසුන් පාසල මැද මිදුලේ පෙළ ගැසුණි. මෙම අවස්ථාව ඉතාමත් චංචල එකක් විය.

"කරුණාකරලා සියළු දෙනාම නිශ්ශබ්ද වන්න.ලියෝ රජතුමා එනවා."වේදිකාව මත සිටි Sir ඔලිවර් මයික්‍රෝෆෝනයෙන් පැවසුවේ ය.

ඒත් සමගම සියලුම දෙනා නිශ්ශබ්ද වූහ. එවිට ලියෝ රජතුමා වේදිකාව මතට ගොඩ වූවේ ය.

ලියෝ රජතුමා යනු ඉතාමත් තේජවන්ත, බුද්ධිමත් මෙන්ම කාරුණික සිංහයෙකි.ඔහුගේ තේජවන්ත බව හිසේ පැලඳි රන්වන් පැහැ,වටිනා මැණික්වලින් නිමවූ කිරුළෙන් තව තවත් වැඩි වේ.එමෙන්ම එතුමාට දුඹුරු පැහැ ඇස් සහ තද දුඹුරු පැහැති කේශර ඔහුට හිමි වේ.

"සාදරයෙන් පිළිගන්නවා ළමයිනේ. අද දන්නවා ඇති කිලෝනාව කියන්නේ ශ්‍රේෂ්ඨවත් අභිමානවත් රාජ්‍යයක්. ගිලෝනාව මේ වගේ දිදුලන්න ප්‍රධානම හේතුව තමයි අපේ අනාගතේ.ඒ තමයි ඔයාලා.ඔයාලා බුද්ධිමත් වගේම කාරුණික වෙන තරමට ගිලෝනාව තව තවත් බැබලෙනවා.ඔයාලට ගොඩක් හැකියාවන් තියෙනවා ඒ අතරිනුත් අතිදක්ෂකයින් වෙනුවෙන් අපි තරගයක් තියෙනවා.මම හිතනවා ඔලිවර් ඒ ගැන තවදුරටත් පැහැදිලි කරයි කියලා." යැයි ලියෝ රජතුමා තම ගැඹුරු කට හඬින් පැවසුවේ ය.

"සුභ උදෑසනක් ළමයි මම ඔයාලට අද පැහැදිලි කරන්න යන්නේ වසර තුනකට වරක් පැවැත්වෙන , එක්සත් රන් කුසලාන තරගාවලිය සම්බන්ධයෙන් හැම පාරකම වගේ ම මේ පාරත් මේ තරගයට ඔයාලගෙන් තුන් දෙනෙක් තෝරගන්නවා.ඒ අයගේ සුදුසුකම් විදිහට තීක්ෂණ බුද්ධිය ,සමාජ දැනීම,රාමුවෙන් පිට හිතීම වගේම නිර්මාණශීලීත්වය තියෙන්න ඕනේ.දැන් අපි ඔයාලගෙන් අහනවා ප්‍රශ්න තුනක්. මේ ප්‍රශ්නවලට හරි උත්තර දෙන්න පුළුවන් වුණු අයට තරගයට ඇතුල් වෙන්න පුළුවන්." යැයි සර් ඔලිවර් පැවසුවේ ය.

පළවෙනියට කියන්න ඕන මේ ප්‍රශ්න කෙනෙක්ට අමාරු වෙන්නත් පුළුවන් තවත් කෙනෙක් ට ලේසි වෙන්නත් පුළුවන් .

ඔයා මං ගැන හොඳටම දන්නවා,ඔයා ඉන්න හැම තැනකම මාත් ඉන්නවා.හැබැයි වෙලාවක් එනවා මට ඔයාගෙන් යන්න වෙන.

සියලු දෙනාගේ නිශ්ශබ්දතාවය මැද ඉතා සියුම් කටහඬක් ඇසෙන්නට විය.

"පිළිතුර තමයි සෙවණැල්ල.අපි සෙවණැල්ල ගැන හොඳටම දන්නවා.සෙවණැල්ල අපි එක්ක හැමවෙලාවෙම ඉන්නවා.හැබැයි ඉර මුදුන් දැනට වෙලාවට සෙවණැල්ල නැතිවෙනවා."

"අනර්ගයි චීම්" සර් ඔලිවර් සිනහ පිරි මුහුණෙන් පැවසුවේ ය.

චිම් යනු කහ කිරිලි පැටියකි.ඇයට නිල් පාට ඇස් සහ කහ පාට පිහාටු තිබුණු අතර ඉතා වේගයෙන් පියාසර කිරීමට හැකියාවක් ඇත.ඇය තරමක් ලැජ්ජශීලී සහ කාරුණික අයෙකි.

## දෙවන ප්‍රශ්නය

"මේ දේ ඔයාලට අයිති හැබැයි මේ දේ පාවිච්චි කරන්නේ වෙන අය"

"ඒක ලේ සීනි උත්තරය තමයි නම." යනුවෙන් කවුරුන්දෝ පැවසුවේ ය.

"උත්තරේ හරි ලූකා." යැයි සර් ඔලිවර් පැවසුවේ ය.

ලූකා යනු මුවපැටියෙකි.ඔහුට තරමක් කෙට්ටු ශරීරයක් හිමි අතර කළු පැහැති ඇස් යුගලයක් දරයි. ඔහුගේ ගුරු පාට සම මත සුදු පැහැති තිත් ඇත. ඔහු තරමක් ආඩම්බර හා උත්සහවන්ත අයෙකි.

## තෙවන ප්‍රශ්නය

"මම ආහාර ගන්නවා. හැබැයි ජීවත් වෙන්නේ නැහැ. මගේ ආහාර අවසන් වන විට මම මිය යනවා."

ලෝරා මනසින් මෙසේ සිතන්නට විය."ජීවත් වෙන්නේ නැහැ,හැබැයි ආහාර ගන්නවා. ආහාර ඉවර වුණා ම මිය යනවා.අනේ මන්දා... ආ පොඩ්ඩක් ඉන්න.. උත්තරේ තමයි ගිනි ගොඩ,ගිනි ගොඩ ඇවිලෙන්න දර ඕනේ,ඒ නිසා ගින්දට දර ආහාරයට ගන්නවා.ආහාර ගත්තට ගින්දර ජීවමාන නැහැ ඒ වගේම දර අවසන් වුණා ම ගින්දර නිවෙනවා."

"විශිෂ්ටයිනේ රෝරා"සර් ඔලිවර් පැවසුවේ ය.

"එහෙනම් දැන් අපිට තරගකරුවෝ තුන්දෙනෙක් ම ඉන්නවා මම හිතනවා ඔයාලට ගිලෝනාව බබළවන්න පුළුවන් වෙයි කියලා."ලියෝ රජතුමා මහත් ආඩබරයෙන් පැවසුවේ ය.

"තරගකරුවෝ විතරක් ඉඳලා අනිත් හැමෝම නම් මෙතනින් යන්න."සර් ඔලිවර් පැවසුවේ ය.

අනෙකේ අය පිටව ගිය පසු,මොවුන් ළඟට ලියෝ රජු මොවුන්ට අතට අත දී සුභ පැතුවේ ය.

ඉන් පසු ඔවුහු පිටව ගියහ.රෝරා තම මිතුරිය සොයා ගමන් කළා ය.

"සුභ පැතුම් රෝරා!මම දැනන් හිටියා ඔයාට කවුරු හරි මේකට යන්න පුළුවන් වෙයි කියලා" ජෙනට් තම මිතුරිය රෝරාව වැළඳ ගනිමින් පැවසුවා ය.

"ස්තූතියි ජෙනට්" රෝරා පැවසුවා ය.

ඉන්පසු ඔවුන් දෙදෙනා නිවෙස් කරා පිටත් විය.තබ නිවසට ඇතුළු වූ රෝරා තම මව වූ සුසීට සියල්ල පැවසුවා ය. ඇය ඉමහත් ප්‍රීතියට පත්වූවා ය.ඉන්පසු ඇය තව දියණියට කේක්,වටලප්පම් ආදී රසවත් ආහාර වේලා සකසා දුන්නනා ය.ඉන්පසු ඔවුහු නින්දට යන්නට වූයේ පසු දිනට යෙදී තිබූ තරගයට සහභාගී වීමේ අරමුණි ය.

අඳුරු රාත්‍රියකට පසු පුල පුලා බලා සිටි දිනය උදා විය. උදෑසනම අවදි වූ රෝරා වෙනදා මෙන් අලස නොවී පිළියෙල වූයේ තමාගේ තරගාවලියට සහභාගී වීමටයි . මෙවර තරගය පැවැත්වීමට තිබුණේ ගිලානා නගරයේ මහා විල අසල දීය. සුසී හා ජෙනට් සමග රෝරා එම ස්ථානයට යන විට අනෙක් තරගකරුවන් වූ චිම් සහ ලූකා ද පැමිණ සිටියහ. සහ ලියෝ රජු පැමිණියහ. එමෙන් ම රාජධානියේ සියලු වැසියන් මෙම අවස්ථාවට පැමිණසිටියහ.

සියලු අමුත්තන් පැමිණි පසු සර් ඔලිවර් තම කතාව ආරම්භ කළේ ය.

"සියලූම නගර වැසියන්ගෙන් අවසරයි! ඔයාලා හැමෝම දන්නවා අද මෙම ස්ථානයේ දී ගිලෝනා එක්සත් රන් කුසලාන තරගාවලිය පැවැත්වෙනවා.මේ තරගයේ සුවිශේෂීත්වය තමයි මේ තරගය දිනන්න නම් එකමුතුකම අනිවාර්යයි."

"තරගාවලිය පුරාම අභියෝගය නැත්නම් ප්‍රශ්න හතරක් තියෙනවා.මෙම අභියෝගය සාර්ථකව අවසන් කරන්න අපේ කණ්ඩායමට හැකියාව ලැබුණොත් තරගය ඔවුන් ජයග්‍රහණය කරනවා.මේ පාර අපේ තරගකරුවන් තුන්දෙනා තමයි රෝරා,චිම් සහ ලූකා.මම එයාලට වේදිකාවට ආරාධනා කරනවා."

ඉන්පසු තර්ගකරුවෝ වේදිකාව මතට පැමිණියහ.ඒ විට එහි පැමිණ සිටි සියලු දෙනා ඔවුන්ට ඔල්වරසන් දෙන්නට විය.

"හරි එහෙනම් අපි තරගය ආරම්භ කරමු." සර් ඔලිවර් පැවසුවේ ය.

එහිදී ගිලෝනා රන් කුසලානය වේදිකාවට ගෙන එන ලදී .ඉන්පසු එය වේදිකාව මත වූ මේසයක් මත තබන්නට විය.ඉන්පසු මේසය මත කුඩා කුප්පි තුනක් තබන්නට විය.

"මේ තියෙන්නේ ඔයාලට ලැබෙන කුසලානේ, හැබැයි ඒක ලැබෙන්නේ මේ කුප්පි තුනේ තියෙන ප්‍රශ්නවලට හරියට උත්තර දුන්නොත් විතරයි .ඔයාලා එක එක්කෙනා ගානෙ ඇවිත් මේ කුප්පි තුනෙන් එක එක තෝරගන්න." සර් ඔලිවර් පැවසුවේ ය.

ඉන්පසු තරගකරුවන් එසේ සිදු කරන්නට විය.

"දැන් ඔය කුප්පි ඇරලා බලන්න. ඒවායේ එක මාතෘකාව ගානේ තියෙනවා.තමන් ගත්ත කුප්පියේ තියෙන මාතෘකාවට අදාල ගැටලුවක් තමයි ඔයාලට හම්බෙන්නෙ." සර් ඔයිලර් පැවසුවේ ය.

"හරි එහෙනම් මම තර්ගයේ ප්‍රශ්න අහන්න කලින් ඔයාලට තරගයේ නීති මතක් කරන්නම් .

"පළවෙනි නීතිය තමයි ලබා දෙන කාලය ඇතුලට දී පිළිතුර ලබාදෙන්න ඕනේ.දෙවෙනි නීතිය තමයි ලාබාදීන පිළිතුර සඳහා සාධාරණ තර්කයක් තියෙන්න ඕනේ. තුන්වෙනි නීතිය තමයි තමන්ට ලැබෙන ප්‍රශ්නය වෙන කෙනෙක්ට දෙන්න හරි,ඒ ගැටලුව අතාරින්න හරි බැහැ.ඒ වගේම හතරවෙනි නීතිය තමයි කිසිම කෙනෙක්ට අවැඩක්,නැත්තන් ද්‍රෝහිකමක් කරන්න බෑ. පස්වෙනි වගේම අවසාන නීතිය තමයි මේ හැම නීතියක් ම ඔයාලා හරියටම පිළිපදින්න ඕනේ."

"මම අය පාරක් ඔයාලට මතක් කරනවා.ඔයාලා මං අහන ප්‍රශ්න හරියට ම හරියටම උත්තර දෙන්න ඕනේ.එහෙම වුනොත් තමයි ඔයාලට තරගය දිනන්න පුළුවන්.හැම අවුරුදු තුනකටම තව තියෙන මේ තරගයට ඔයාල වගේ දක්ෂයෝ ගොඩක් සහභාගි වුණත් ඒ හැම කෙනෙක්ටම තර්ගය ජයග්‍රහණය කරන බැරි උනා......ඒ නිසා මම ඔයාලට නැවතත් කියනවා මේ තරගෙ තියෙන ඇත්තම ජයග්‍රහණය හොයාගන්න. මම ඔයාලා හැමෝටම සුභ පතනවා." සර් ඔලිවර් ඉතා සන්වේදිව පැවසුවේ ය.

හරි මගේ අතේ තියෙනවා ඉරටු කුරු තුනක් මේ ඉරටු කුරු තුනෙන් හැමෝම එක ගානේ ගන්න." සර් ඔලිවර් පැවසුවේ ය.

රෝරා,චිමි සහ ලූකා සර් ඔලිවර් අතේ තිබූ ඉරටු ලබාගත්තෝ ය.

"ඔයාල ගත්ත ඉරටුවලින් කොටම ඉරටු කෑල්ල තියෙන්නේ කාටද?" සර් ඔලිවර් ඇසුවේ ය.

එවිට චිමී තම අත ඔසවා ,තමන් බව ඇගෙව්වේ ය.

"තර්ගය වෙන්නේ මෙහෙමයි.කොටම ඉරටු කෑල්ල තියෙන කෙනාගෙන් එයා තෝරගත්ත කුප්පිය තියෙන මාතෘකාවට අදාළව ප්‍රශ්නය අහනවා.එයා උත්තර දීල ඉවර වුනාට පස්සේ මධ්‍යම ප්‍රමාණයේ ඉරටු කෑල්ල තියෙන කෙනාගේ එයාගේ මාතෘකාවට අදාළ ප්‍රශ්නය අහනවා.ඊට පස්සේ දිගම ඉරටු කෑල්ල කෙනාගෙන් එයාට අදාළ මාතෘකාවේ ප්‍රශ්නය අහනවා." සර් ඔයිලර් පැවසුවේ ය.

"හරි පළවෙනි වසනාවන්තයා තමයි අපේ චිමි. ඔයාට ලැබුන මාතෘකාව මොකක්ද?" සර් ඔලිවර් ඇසුවේ ය.

## පළමු ප්‍රශ්නය

"දල්වන්න ...........චිමී පැවසුවා ය.

"මේක තමයි චිමීට අදාළ ප්‍රශ්නය මේ ප්‍රශ්නෙට උත්තර දෙන්න චිමීට මිනිත්තු දෙකක් ලැබෙනවා." සර් ඔලිවර් පැවසුවේ ය.

"ඔයා එක ගිනි කූරක් තියෙනවා.මේ වෙලාවේදී ඔයා ඉන්න තැන හරි ම අඳුරුයි ,කරුවලයි, ඒ වගේම හරි ම සීතලයි. ඔයා ළඟ තියෙනවා ලන්තෑරුමක්,ගිනි උදුනක්, ඉටිපන්දමක්.ඔයා පලවෙනියට ම දල්වන්නේ මොකක්ද?

මද වේලාවක් කල්පනා කෙරූ චිම් මෙසේ පිළිතුරු දුන්නා ය .

"පිළිතුර තමයි ගිනි කූර.මොකද ලන්තෑරුම හරි ගිනි උදුන හරි ඉටිපන්දම හරි දල්වන්න ගින්දර තියෙන්න ඕනෙනේ.ඒ නිසා පළවෙනියට ම ගිනි කූර දල්වන්න ඕනේ."

"පිළිතුර නිවැරදි ." සර් ඔලිවර් පැවසුවේ ය.

මීළඟට අවස්ථාව තිබුණේ රෝරා වෙතයි.

"ඔයාගේ මාතෘකාව මොකක්ද රෝරා ?" සර් ඔලිවර් ඇසුවේ ය.

## දෙවන ප්‍රශ්නය

මේ ප්‍රශ්නේ දි ටිකක් තාර්කිකව හිතන්න වෙනවා.

" ඇත්තද? බොරුද?"රෝරා පැවසුවා ය.

අලියා, කොටියා, වළහා, පූසා ,මීයා කියලා යාළුවො පස්දෙනෙක් ඉන්නවා. මෙයාලා හැමෝම විනෝද චාරිකාවක් යනවා.මෙයාලා චාරිකාවේ ගිහිල්ලා නැවත ආවට පස්සේ එක එක්කෙනාගෙන් එයාලා කරපු දේවල් අහනවා.

අලියා = කඳු නඟින්න ගියා
කොටියා = වොලිබෝල් ගැහුවා
පූසා = පිහිනුවා
වළහා = අයිස් ක්‍රීම් කෑවා.
මීයා = ප්‍රසංගයක් බැලුවා.

මෙයාලා පස්දෙනාගෙන් හතර දෙනෙක් ඇත්ත කියනවා.අනෙක් එක්කෙනා බොරු කියනවා.

රෝරා හොඳින් කල්පනා කරන්නට විය. මද වේලාවකින් පසු ඇගේ මුහුණට මද සිනාවක් පහළ විය.

"මේක හොඳ ප්‍රශ්නයක් මෙතන තියෙනවා නේද පූසා පේනවා කියලා.හැබැයි අපි හැමෝම දන්නවනේ පූසන්ට පීනන්න බෑ කියලා.ඒ නිසා පිළිතුර තමයි පූසා." රෝරා පැවසුවා ය.

මීලඟ අවස්ථාව ලැබී තිබුණේ ලූකා වෙතයි.

"ඔයාගේ මාතෘකාව මොකක්ද ලූකා? "

## තෙවන ප්‍රශ්නය

" තොප්පි ........." ලූකා තරමක් අමුතුවෙන් පැවසුවේ ය.

"වැරදිකරුවන් තිදෙනෙක් සිටිනවා.රජතුමා මෙයාලට නිදහස දෙන්න අපූරු ක්‍රමයක් තෝර ගන්නවා.රජතුමා ළඟ රට තොප්පි තුනකුයි නිල් තොප්පි දෙකකුයි තියෙනවා.පහත පරිදි සිරකරුවන් තුන්දෙනාව හිටගස්සනවා.ඊට පස්සේ අර තොපිවලින් එක එක ගානෙ පලන්දනවා.හැබැයි කවුරුත් දන්නෑ තමන්ට ලැබෙන තොපිය මොකද්ද කියලා.මේ සිරකරුවන් මේ ආකාරයට ඉඩ ගස්සලා තියෙනවා.

පළවෙනියට C සිරකරු. එයාට කාගේවත් තොප්පියක් පෙන්නේ නෑ .එයාගේ ඉස්සරහින් තාප්පයක් තියෙනවා.

දෙවනියට B සිරකරු.එයාට එයාගේ ඉස්සරහින් ඉන්න C තොප්පිය පේනවා.

තුන්වෙනියට A සිරකරු.එයාට එයාගේ ඉස්සරහින් ඉන්න C සහ B ගේ

තොප්පි පේනවා.

රජතුමා තිදෙනාගෙන්ම තමාගේ හිස ඇති තොප්පිය කුමන පාටදැයි විමසනවා.ඔවුන් මෙසේ පිළිතුරු දුන්නා.
A = දන්නේ නැහැ.
B = දන්නේ නැහැ.
C =දන්නවා.

C ගේ තොප්පියේ පාට කුමක්ද ? ඔහු ඒ දැනගත්තේ කෙසේ ද?

ලූකාට මෙම ප්‍රශ්නයේ විසඳීමට බර කල්පනාවක යෙදෙන්නට විය. ඔහුගේ බර කල්පනාව අවසාන වූයේ මෙම වචන කිහිපය සමඟිනි.

"මට මේ උත්තරේ විශ්වාස නම් නැහැ වගේ."

"කමක් නෑ ලූකා ඔයාට හිතෙන දේ කියන්න." රෝරා පැවසුවා ය.

"බයවෙන්න එපා ලූකා." චිමී පැවසුවා ය.

"මම හිතනවා C ගේ තොප්පියේ පාට රතු වෙන්න ඕනේ කියලා."

"මොකද A ට B සහ C ගේ තොප්පිවල පාට පේනවා.එය තොපි දෙකම නිල් පාට වුණා නම් එයාට ලේසියෙන්ම උත්තරේ කියන්න තිබ්බ රතු කියලා.හැබැයි එයා දන්නේ නැහැ කිව්වා .ඒ කියන්න එතන රතු තොප්පියක් හා නිල් තොප්පියක් තියෙනවා .

ඊට පස්සේ B ත් කිව්වා දන්නේ නැහැ කියලා. හැබැයි B දන්නවා A ගේ උත්තරය අනුව තමාගේ හා C ගෙන් එක්කෙනෙක්ගේ තොප්පියක් රතු වෙන්න ඕනි කියලා.හැබැයි බීටා සිහිගෙ තොප්පිය සුදු උනානම් ලේසියෙන්ම උත්තර දෙන්න තිබ්බා තමන්ගේ තොප්පිය මොන පාටද කියලා.

මේ කාරණාව හරියට ම C අවබෝධ කර ගත්ත නිසා එයාට නිවැරදි උත්තරේ දෙන්න පුළුවන් වුණා ." යැයි ලූකා පැවසුවේ ය.

"පිළිතුරේ නිවැරදි." යැයි පැවසූ සර් ඔලිවර් ලූකාට ප්‍රශංසා කිරීමට අමතක නොකළේ ය.

"හරි එහෙනම් තරගයේ තියෙන තීරණාත්මක වගේම අවසාන ප්‍රශ්නය මේක .මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අද ආරාධනා කරනවා ගිලෝනා රාජධානියේ රජතුමා වන ලියෝ උතුමානන්ට." සර් ඔලිවර් එසේ පැවසුවේ ය.

ඉන්පසු වේදිකාව මතට පැමිණි ලියෝ රජතුමා අවසාන අභියෝගය ලෝරා,චිමි,ලූකා ට ඉදිරිපත් කළේ ය.

## අවසාන අභියෝගය

"ඉපදෙද්දි මම හිටියේ නැහැ. එහෙත් ඉපදුනාට පස්සේ මම ඉන්නවා.කොහේ ගියත් කවදත් මම දිගටම ඉන්නවා."

යනුවෙන් ලියෝ රජතුමා පැවසුවේ ය.

චිමි රෝරා සහ ලූකා එක් වී මෙසේ සාකච්ඡා කළහ.

"මට හිතෙනවා බුද්ධිය වෙන්න ඇති කියලා." චිමී පැවසුවා ය.

"මට හිතනවා ඒක බුද්ධියටත් වඩා එහා ගිය එකක් කියලා." ලූකා පැවසුවේ ය.

"සමහර විට ඒක මතකය වෙන්න බැරිද?"
රෝරා පැවසූවා ය.

"හ්ම්.......ඉපදෙති හිටියේ නැහැ. එහෙත් ඉපදුනට පස්සේ ඉන්නවා.ඔව් ඒක ගැලපෙනවා වගේ."
චිමී පැවසූවා ය.

"කොහේ ගියත් කවදත් ඉන්නවා. ඔව් රෝරා උත්තරය මතකය තමයි." ලූකා සතුටින් පැවසුවේ ය.

"ළමයි ඔයාලා උත්තරේ හොයා ගත්තද?" ලියෝ රජු ඇසුවේ ය.

"පිළිතුර තමයි මතකය."රෝරා පැවසුවා ය.

"මොකද අපි ඉපදෙද්දි අපිට මතකයක් තිබුණේ නැහැ. හැබැයි අපි ඉපදුනාට පස්සේ අපිට මතකයන් ගොඩක් ලැබෙනවා."ලූකා පැවසුවේ ය.

"අපි කොහේ ගියත් දිගට ම මතකයන් ජීවිතයට එකතු වෙනවා.ඒ වගේ මතකයන් දිගට ම පවතිනවා" චිමී පැවසුවා ය.

"අනර්ගයි ළමයිනේ " ලියෝ රජතුමා ඉමහත් සතුටකින් පැවසුවේ ය.

"අවුරුදු ගානකට පස්සේ මේ කුසලානය දිනාගන්න ඔයාලට පුළුවන් වුණා. ඒ ගැන මට ගොඩක් සතුටුයි ඒ වගේම ගොඩක් ආඩම්බරයි."ලියෝ රජතුමා පැවසුවේ ය.

"එන්න ළමයිනේ ඇවිත් කුසලානේ ගන්න" සර් ඔලිවර් පැවසුවේ ය.

රෝරා , චිමි සහ ලූකා ඉතා ගත් සතුටින් සහ ආඩම්බරයෙන් පැමිණ ලියෝ රජතුමාගේ ගිලෝනා රන් එක්සත් කුසලාන තරගාවලියේ ජයග්‍රහකයන් වශයෙන් තරගාවලියේ කුසලානය ලබාගත්තෝ ය.

"අවුරුදු ගාණක් තිස්සේ මම මේ කරගෙන් සංවිධානයය කරනවා.හැබැයි ඔයාලා වගේ ළමයි කට්ටියක් කවදාවත් දැකලා නෑ. මොකද මම මේ දේවල් ඔයාලගෙන් දැක්කා. ලූකා එවලේ උත්තරේ කියන්න අති මදි කරද්දේ රෝරා සහ චිමී දෙන්න එයාට උදව් කරා.ඒ වගේම අන්තිම ප්‍රශ්නේ දි ඔයාල තුන්දෙනා ම ස්ථිර එක මතයකට ආවා. ඒ වගේම සමඟින් සහයෝගයෙන් වැඩ කරා මම හිතන්නේ ඔයාලට තරගය දිනන්න පුළුවන් වුනේ ම මේ නිසා."සර් ඔලිවර් සතුටු කඳුළු සහිත දෙනෙත් ඇතිව පැවසුවේ ය.

"මම හිතනවා ඔයාලට අනාගතේ දී මුළු රාජධානියටම ආලෝකයක් වෙන්න පුළුවන් වෙයි කියලා."ලියෝ රජතුමා පැවසුවේ ය.

රෝරාගේ කතා වෙනත් අපිට ඉගෙන ගන්න තියෙන්නේ අපි ජයග්‍රහණයේදී බුද්ධිමත් වගේම තාර්කික වෙන්න ඕනේ.හැබැයි අපිට එකමුතුකම වගේම සහයෝගය නැති උනොත් කිසිම ජයග්‍රහණයක් ලබාගන්න බෑ.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

CamScanner